"ඇමුණුම අ"

# ව්‍යවස්ථාව

රාජ්‍ය පාලන බලය ප්‍රජාතන්ත්‍රවාදී ලෙස ලබා ගැනීම සඳහා දැනට ශ්‍රී ලංකාවේ බලපවත්නා මැතිවරණ ක්‍රමයන් හා දේශපාලන ප්‍රවණතාවන්ද සැලකිල්ලට ගනිමින් විසිරී ඇති ප්‍රගතිශීලී දේශපාලන බලවේගයන් ඒකරාශී කොට සියලු ජාතීන්ට බියෙන් සැකෙන් තොරව සාධාරණව ජීවත්විය හැකි ආර්ථික , සමාජීය , සංස්කෘතික , තත්ත්වයන්ගෙන් පරිපූර්ණ වූ උත්තරීතර සමාජයක් බිහිකිරීමේ අභිලාෂයන් මුදුන් පත්කරවා ගැනීම සඳහා ශ්‍රී ලාංකික දේශපාලනයේ ප්‍රගතිශීලී බලවේගයන් ලෙස දීර්ඝ කාලයක් තිස්සේ කටයුතු කරන ලද පහත අත්සන් කරන ලද ලියාපදිංචි දේශපාලන පක්ෂ හා කණ්ඩායම් එකම ධජයක් යටතේ තම තමන්ගේ පක්ෂවල පරමාර්ථයන් සාක්ෂාත් කරගැනීමට අමතරව ඉහත කී පොදු පරමාර්ථයන් සාක්ෂාත්කර ගැනීම සඳහාත් එකී දේශපාලන පක්ෂ හා කණ්ඩායම්වල පූර්ණ අනුමැතිය මතත් මෙහි පහත දැක්වෙන අරමුණු හා පරමාර්ථයන් පෙරදැරිකොටගෙන එක්සත් ජනතා නිදහස් සන්ධානය නම් වූ මෙහි මතු අත්සන් තබන දේශපාලන පක්ෂ හා කණ්ඩායම්ගෙන් සමන්විත මැතිවරණ සන්ධානයක් යටතේ ඒකරාශීව එකී මැතිවරණ සන්ධානය ශ්‍රී ලංකාවේ දැනට බලපවත්නා මැතිවරණ නීතිය යටතේ ලියාපදිංචි දේශපාලන පක්ෂයක් ලෙස කටයුතු කළ යුතු බවටත් එසේ කටයුතු කිරීමේදී මෙකී ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධාන යටතේ කටයුතු කිරීමට ඔවුනොවුන් අතර එකඟ වූ බවටත් මෙයින් සහතික කරමු.

(01) පක්ෂයේ නම එක්සත් ජනතා නිදහස් සන්ධානය ( මින් මතු මෙම ව්‍යවස්ථාවේ "සන්ධානය" ලෙස සඳහන් කරන අතර මෙයට පාර්ශවකරුවන් වන දේශපාලන පක්ෂ හා සංවිධාන සමාජික පක්ෂ ලෙස හඳුන්වනු ලැබේ.)

(02) පක්ෂයේ ලාංඡනය "බුලත් කොළය" ( ) වන්නේය.

(03) මෙම සන්ධානයේ ලියාපදිංචි කාර්යාලය අංක 301 , ටී.බී. ජායා මාවත , කොළඹ 10 යන ස්ථානයේ පැවැත්විය යුතුය.

(04) මෙම සන්ධානය සමග සමාජික පක්ෂ සහ සංවිධාන ඇතුළු අනෙකුත් සංවිධාන හා පුද්ගලයින් කරනු ලබන සියලු ලිපි හුවමාරුවල දී හා කටයුතුවලදී ඒවා සන්ධානයේ අදාළ නිළධාරීන් වෙත සන්ධානයේ ලියාපදිංචි කාර්යාලය වෙත යොමු කළ යුතුය.

(05) **සන්ධානයේ අරමුණු හා පරමාර්ථ**

(05). 01. ජාතික නිදහස , ස්වෛරීභාවය හා භෞමික අඛණ්ඩතාව ආරක්ෂා කිරීම

(05). 02. සමාජ යුක්තිය හා මානව අයිතිවාසිකම් පදනම් කරගත් සමාජයක් බිහිකිරීමට කටයුතු කිරීම

(05). 03. ප්‍රජාතාන්ත්‍රික අයිතිවාසිකම් හා පිළිවෙත් සුරක්ෂිත කිරීම හා ප්‍රවර්ධනය කිරීම

(05). 04. ශ්‍රී ලාංකික ජනතාවගේ ආර්ථික , සමාජීය , සංස්කෘතික හා අධ්‍යාත්මික උන්නතිය ප්‍රවර්ධනය කිරීම

(05). 05 ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ ජනවාර්ගිකත්වය , ආගමික ඇදහිලි හෝ ලබ්ධිය කුමක් වුව ද , ඔවුන් සියලු දෙනාම සමානත්වයෙන් සැලකීමේ හා ඔවුන් සියලු දෙනාටම සමාන අවස්ථාවන් ලබාදීමේ පදනම මත ශ්‍රී ලංකාවේ සියලු ප්‍රජාවන් අතර ජාතික සමගිය හා මිත්‍රත්වය සහ සහයෝගය ප්‍රවර්ධනය කිරීම

(05). 06. හෘදය සාක්ෂි නිදහස , ආගමික වන්දනාව හා පිළිවෙත් පිළිබඳ නිදහස පිළිගැනීම

64-I c

(05). 07. නොබැඳි ජාතීන්ගේ ව්‍යාපාරයට සහ වෙනත් රටවල ජාතික විමුක්තිය , ප්‍රජාතන්ත්‍රවාදය හා සමාජීය ප්‍රගතිය පතා කෙරෙන ජනතා අරගලවලට සහාය දීම

(05). 08. ලෝකයේම සාමය , සාමාන්‍ය හා පරිපූර්ණ නිරායුදකරණය වෙනුවෙන් අවශ්‍ය සියලුම ක්‍රියාමාර්ගයන් වෙත හැම විටම ඉදිරිපත් වීම

(05). 09 ඉහත කී 5.1 සිට 5.8 දක්වා ජේදයන්හි සඳහන් පරමාර්ථයන් මුදුන්පත් කරවා ගැනීම සඳහා ශ්‍රී ලාංකික ජනතාව දැනුවත් කිරීමත් ඒවා ක්‍රියාවට නැංවීම සඳහාත් අවශ්‍ය දේශපාලන බලය ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යුහය තුළ මැතිවරණ ක්‍රමයන් තුළ ලබා ගැනීම සඳහා කටයුතු කිරීම

(05). 10 යම් දේශපාලන පක්ෂයක් හෝ කණ්ඩායමක් විසින් ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් උල්ලංඝනය කරමින් ජනතා අයිතීන් පාගා දමමින් කටයුතු කරන අවස්ථාවන්හි දී පාර්ලිමේන්තුව තුළත් ඉන් පිටතත් එවැනි ක්‍රියාවන්ට එරෙහිව නැගී සිටීම. ප්‍රජාතන්ත්‍රවාදී ලෙස විරෝධතාවන් දැක්වීම හා උද්ඝෝෂණ කටයුතුවල නිරතවීම

(05). 11 සන්ධානය මගින් තීරණය කරනු ලබන මැතිවරණයන්හිදී ඒවා තරග කිරීම සඳහා සන්ධානය මගින් අපේක්ෂකයන් ඉදිරිපත් කිරීම හා එකී අපේක්ෂකයන් ජයග්‍රහණය කරවීම සඳහාත් සාමුහිකව දේශපාලන කටයුතුවල නිරත වීම.

(06) සන්ධානයේ සමාජිකත්වය

(06). 01 ඉහත තී 5 වන වගන්තියේ සඳහන් අරමුණු හා පරමාර්ථයන් පිළිගන්නාවුත් මෙම ව්‍යවස්ථාව පිළිගන්නාවුත් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි දේශපාලන පක්ෂ සහ සංවිධානවලට සන්ධානයේ සමාජිකත්වය ලබාගැනීම සඳහා ඉල්ලුම් කළ හැක.

(06). 02 එසේ කරන ලද ඉල්ලීම් ශලකා බලා සන්ධානයේ පොදු අරමුණු හා කටයුතු සඳහා අයදුම් කරනු ලබන සමාජික පක්ෂය සුදුසු යැයි මින් මතු දැක්වෙන සන්ධානයේ විධායක සභාව තීරණය කිරීමෙන් පසුව එකී අයදුම්කාර පක්ෂයට සන්ධානයේ සාමාජික පක්ෂයක් ලෙෂ ඇතුලත් විය හැකිය.

(06). 03. එසේ සන්ධානයේ සාමාජිකත්වය සඳහා විධායක සභාවේ තීරණය අනුව සාමාජිකත්වය ලබාදෙන සාමාජික පක්ෂත් මෙම ව්‍යවස්ථාව සඳහා අත්සන් තබන අවස්ථාවේ දී සන්ධාන ගතවීමට ඉදිරිපත් වන සාමාජික පක්ෂත් සන්ධානයේ විධායක සභාව විසින් නියම කරනු ලබන වාර්ෂික දායක මුදලක් සෑම වර්ෂයකම ජනවාරි මස 31 වන දිනට ප්‍රථම ගෙවිය යුතුය.

(06). 04 ඕනෑම සාමාජික පක්ෂයකට තමන්ගේ අභිමතය පරිදි එම පක්ෂයේ ලේකම්වරයා විසින් ලිඛිත ඇමතීමක් සන්ධානය වෙත හා සන්ධානයේ සාමාජික පක්ෂ වෙත යොමු කිරීමෙන් අනතුරුව එකී දැන්වීම විධායක සභාව ඉදිරියට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව සන්ධානයේ ඉල්ලා අස්විය හැකිය.

(06). 05 සාමාජික පක්ෂයෙක් සන්ධානයෙන් ඉල්ලා අස්වුවද , එකී පක්ෂය මගින් නම් කොට ඕනෑම මැතිවරණයකට සන්ධාන ලැයිස්තුවෙන් ඉදිරිපත්ව තේරී පත්වූ අපේක්ෂකයකු හෝ සන්ධානය මගින් පත්කරන මන්ත්‍රීවරයකු පත්වීම පිළිබඳව විනයානුකුල පියවර ගැනීමට සන්ධානයට පූර්ණ අයිතියක් ඇත.

(07). 01 විධායක සභාව සන්ධානයේ උත්තරීතර මණ්ඩලය වන අතර මෙම ව්‍යවස්ථාවේ නිලධාරී මණ්ඩලය වෙත හා කමිටු වෙත පවරා ඇති විෂයයන් හා කටයුතු ඇතුළු සියළු කටයුතු පිළිබඳ අවසන් තීරණ ගැනීමේ බලය විධායක සභාව වෙත පැවරේ.

(07). 02. හැකිතාක් දුරට තීරණ ගැනීමේදී එකගත්වය මත තීරණ ගත යුතු අතර එසේ එකගත්වයට පැමිණිමට නොහැකි අවස්ථාවන්හිදී බහුතර මතය මත පදනම් වූ තීරණ විධායක සභාව විසින් ගත යුතු අතර, ඒවා ක්‍රියාත්මක කිරීමටත් ඒ අනුව කටයුතු කිරීමටත් සන්ධානය හා සාමාජික පක්ෂ බැඳී සිටී.

(07). 03. විධායක සභාවේ අභිමතය පරිදි අවස්ථාවෝචිත පරිදි විධායක මණ්ඩලය විසින් එහි අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික හෝ ප්‍රාදේශීය වශයෙන් කමිටු පත්කිරීමට විධායක සභාවට බලය ඇති අතර එසේ කමිටු පත්කිරීමේදී සන්ධානයේ සාමාජික පක්ෂ අතර විධායක සභාවේ ඇති බල තුලනයට සමාන වන අන්දමින් එකී කමිටු පත් කළ යුතු වේ. එකී කමිටු හා එහි සාමාජිකයන් විධායක සභාවේ නියෝග හා උපදෙස් අනුව කටයුතු කළ යුතු අතර , එකී සාමාජිකයන් කමිටුවලින් ඉවත් කිරීමටත් , එකී කමිටු විසුරුවා හැර නව කමිටු පත් කිරීමටත් , පිහිටුවා ඇති කමිටු විසුරුවා හැර අහෝසි කිරීමටත් විධායක සභාවට බලය ඇත.

(07). 04. විධායක සභාවේ සියලු රැස්වීම් තීරණ පිළිබඳය ලිඛිත වාර්තා පවත්වාගෙන යා යුතුය.

(07). 05. විධායක සභාවේ සංයුතිය

(07). 05. 01 සන්ධානයේ විධායක සභාව මින් මතු සඳහන් කරන ආකාරයට එක් එක් සාමාජික පක්ෂ මගින් නම් කරනු ලබන සාමාජිකයන් 72 කින් සමන්විත යුතුය. සන්ධානයේ සාමාජිකත්වය ලබා ගැනිම සඳහා ඉදිරියේ දී කරනු ලබන ඉල්ලීම් අනුව මෙම ව්‍යවස්ථාවේ එක් එක් සාමාජික පක්ෂ සඳහා ලබා දී ඇති බල තුලනය එලෙසම පවත්වාගෙන යන අයුරින් විධායක සභාවේ සාමාජිකත්වය විධායක සභාවේ සම්මත කරනු ලබන යෝජනාවක් මගින් අවස්ථාවෝචිත පරිදි අඩුවැඩි කළ හැකිය.

(07). 05. 02 විධායක සභාව සඳහා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට පත්කළ හැකි නිළධාරීන් ප්‍රමාණයක් ද සමග විධායක සභාවේ සම්පූර්ණ සාමාජික සංඛ්‍යාවෙන් අඩකට එකක් එකතු කිරීමෙන් ඇතිවන සංඛ්‍යාව හා සමාන සංඛ්‍යාවට නොඅඩු 49 ට නොවැඩි සංඛ්‍යාවක් විධායක සභාවේ සාමාජිකයන් වශයෙන් පත්කිරීමට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට හිමිකම ඇත්තේය.

(07). 05. 03 විධායක සභවේ සාමාජිකයන් පත්කිරීම මෙම සන්ධානයේ සාමාජිකත්වය දරන අනෙකුත් පක්ෂවලට හැකිවන අතර , ඒ එක් එක් පක්ෂයට පත්කළ හැකි සාමාජික සංඛ්‍යාව විධායක සභාව මගින් අදාල සියලු පක්ෂ සමග සාකච්ඡා කොට තීරණය කළ යුතුය. මේ පිළිබඳව විධායක සභාව දෙනු ලබන තීරණය අවසන් තීරණය වේ.

(07). 05. 04 විධායක සභාවේ සංයුතිය

මින් මතු දැක්වෙන අයුරින් විධායක සභාවේ සාමාජිකයන් අතුරින් පත්කරගනු ලබන පහත සදහන් නිළධාරී මණ්ඩලයෙන් විධායක සභාව සමන්විත වේ.

1) සන්ධානයේ නායක
2) සභාපති
3) ප්‍රධාන ලේකම්
4) ජාතික සංවිධායක
5) භාණ්ඩාගාරික
6) උප සභාපතිවරු අටදෙනෙක් (උපරිම)
7) උප ලේකම්වරු අටදෙනෙක් (උපරිම)
8) විධායක සභිකයන් (1-7 දක්වා වු නිලධාරි මණ්ඩලයට ඇතුලත් නොවන විධායක මණ්ඩලයේ සියලු සාමාජිකයන් විධායක සභිකයන් ලෙස සලකනු ලැබේ.)

(07). 05. 05 සන්ධානයේ නායක , ප්‍රධාන ලේකම් , ජාතික සංවිධායක යන තනතුරු සඳහා පුද්ගලයන් නම් සිරීමේ පූර්ණ අයිතිය ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙත පැවරෙන අතර එම පක්ෂයෙන් නම් කරනු ලබන පුද්ගලයන් එම තනතුරු සඳහා අනිවාර්යෙන්ම පත්වේ.

(07). 05. 06 සෙසු තනතුරු විධායක සභාවේ සභිකයන් අතුරින් පත්කර ගත යුතු අතර එසේ පත්කිරීමේ දී හැකිතාක්දුරට නිලධාරි මණ්ඩලය තුළ සෑම සාමාජික පක්ෂයකටම නියෝජනයක් ලැබෙන පරිද්දෙන් එම තනතුරු සඳහා පුද්ගලයන් පත්කර ගත යුතු වේ. පොදු එකගතාවයකින් මෙම පත්කිරීම් සිදුකිරීමට සෑම උත්සාහයක්ම ගත යුතු අතර එසේ නොහැකි අවස්ථාවන්හිදි බහුතර කැමැත්ත අනුව පත්වීම් කළ යුතුය.

(07). 05. 07 අදාළ දේශපාලන පක්ෂවලට විධායක සභාවට සාමාජිකයන් නම් කිරීමට හා තනතුරු සඳහා පුද්ගලයින් නම් කිරීමට ඇති අයිතිය ක්‍රියාත්මක කරමින් ඒ ඒ දේශපාලන පක්ෂ ගනු ලබන තීරණ අනුව ඕනෑම අවස්ථාවකදී එසේ පත්කරන ලද සමාජිකයන් හෝ පුද්ගලයන් එකී තනතුරුවලින් හෝ විධායක සභාවේ සාමාජිකත්වයෙන් ඉවත් කරන ලෙස ඉල්ලා සිටීමට අදාළ පක්ෂයේ ලේකම්වරයාට බලය ඇත්තේය. එවැනි ඉල්ලීමක් ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ පසු විධායක සභාව එකී ඉල්ලීමට නොපමාව ඉඩදිය යුතුය. එවැනි අවස්ථාවකදී ඇතිවන පුරප්පාඩුව සඳහා නව සාමාජිකයකු හෝ නිළධාරියකු පත්කිරීමේ බලය අදාළ පක්ෂයේ ලේකම්වරයා වෙත පැවරේ.

(07). 05. 08 සන්ධානය නමින් බැංකු ගිණුමක් හෝ ගිණුම් ලංකාවේ ඕනෑම බැංකුවක විවෘත කිරීම සඳහා ඒ පිළිබඳව වු යෝජනා සම්මතයකින් පවත්වාගෙන යාමට බලය දීමට විධායක සභාවට බලය ඇත. එසේ පවත්වාගෙන යනු ලබන බැංකු ගිණුමකට අදාළව බැංකු ගිණුම් විවෘත කිරීමත් , ඒවා පවත්වාගෙන යාමත් , ඊට අදාළව චෙක්පත් අත්සන් කිරීම , මුදල් බැංකු අණකර ඇතුළු බැංකුවට අදාල උපදෙස් දීම පෙරමුණේ තත්කාලයේ නායක , සභාපති , භාණ්ඩාගාරික හා ලේකම් යන නිල දරන පුද්ගලයන්ගේ ඕනෑම දෙදෙනකුගේ අත්සනින් විය යුතුය.

## (08) නිලධාරීන්ගේ බලතල හා වගකීම්

### (08). 01. සන්ධානයේ නායක

මෙය සන්ධානයේ උසස්ම නිලය වන අතර ජාතික හා ජාත්‍යන්තර සෑම මට්ටමකදීම, දේශපාලන කටයුත්තකදීම සන්ධානය නියෝජනය කිරීමටත් , සන්ධානයේ ප්‍රතිපත්ති , වැඩ පිළිවෙළ හා කටයුතු පිළිබඳවත් එහි දේශපාලන දර්ශනය පිළිබඳවත් ප්‍රකාශ කිරීමත් සන්ධානය ජනතාව අතර ජනප්‍රිය කිරීම සඳහාත් එය ආරක්‍ෂා කිරීම සඳහාත් අවශ්‍ය දේශපාලන නායකත්වය ලබාදීමත් , සන්ධානයේ නායකවරයා වෙත පැවරේ. තව ද සන්ධානයේ විධායක සභාවෙත් සන්ධානය මගින් සංවිධානය කරනු ලබන දේශපාලන රැස්වීම් , සාකච්ජා උත්සවවලදීත් මුලසුන දැරීම ද එවැනි කටුයතු සඳහා පෞද්ගලිකව සහභාගි විය නොහැකි අවස්ථාවක දී විධායක සභාව ඇතුළු අනෙකුත් අවස්ථාවන්හිදිත් මුලසුන දැරීමට විධායක සභාවේ නිලධාරීන් හා සාමාජිකයන් අතුරින් අයෙකු නම් කිරීමේ බලය ද නායකවරයා වෙත පැවරේ.

### (08). 02 සභාපති

(08). 02. 01 විධායක සභාවේ තීරණයන්ට අනුව සන්ධානයේ නායකයා විසින් වරින්වර දෙනු ලබන උපදෙස් හා ඉල්ලීම් මත සන්ධානයට අදාල කටයුතු සඳහා සහභාගිවීම , නායකත්වය සැපයීම හා සන්ධානයේ විධායක සභාව විසින් වරින්වර පවරනු ලබන සාමාන්‍ය හා විශේෂ වගකීම් ඉටුකිරීම.

### (08). 03 ප්‍රධාන ලේකම්වරයා

(08). 03. 01 සන්ධානයේ විධායක සභාව ඇතුළු සියලු කටයුතුවලට අදාළ වාර්තා ලිපිගොනු නිසි ලෙස පවත්වාගෙන යාමත් , ඒවා තමා භාරයේ සුරක්‍ෂිතව තබා ගැනීමත් , සන්ධානය වෙත යොමු කරන ලිපි ඇතුළු වෙනත් නියෝජනයන් අදාළ නිලධාරීන් හා පක්‍ෂ සාමාජිකයන් වෙත යොමු කිරීමත් ඒවාට අවශ්‍ය උපදෙස් ලබාගෙන පිළිතුරු සැපයීමත් සන්ධානයේ කාර්යාලය හා ලිපි කටයුතු නිසිලෙස පවත්වා ගෙන යාමත් ප්‍රධාන ලේකම්වරයාගේ වගකීම වේ.

(08). 03. 02 පිළිගත් දේශපාලන පක්‍ෂයක් වශයෙන් සන්ධානය හා මැතිවරණ කොමසාරිස්වරයා, මැතිවරණ කොමිසම, තේරීම්භාර නිලධාරීන් හා පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා ඇතුළු රජයේ අමාත්‍යාංශ , ආයතන හා නිලධාරීන් සමග අවශ්‍ය සියලු කටයුතු ඉටුකිරීම් ද , ඔවුන් හා එකී ආයතන සමග මැතිවරණ නිති රිති හා රෙගුලාසි යටතේ පැවැත්විය යුතු සම්බන්ධීකරණය හා වැඩ කටයුතු ඉටුකිරීමද පාර්ලිමේන්තුව හා අවශ්‍ය ලිපි ගනුදෙනු ඉටුකිරීම ද මැතිවරණයක දී විධායක සභාව මගින් ගනු ලබන තීරණ පරිදි මැතිවරණ අපේක්‍ෂක ලැයිස්තු නිසි ලෙස සකස් කොට අස්සන් කොට ඉදිරිපත් කිරීම ප්‍රධාන ලේකම්වරයාගේ වගකිම වේ. මෙම වගකීම ක්‍රියාත්මක වීමේදී එය සන්ධානයේ නායකයා වෙත මෙම ව්‍යවස්ථාවෙන් ලබා දි ඇති බලතලවලට අනුකූලව කටයුතු කළ යුතුය. තව ද සන්ධානය වෙනුවෙන් විධායක සභාව විසින් අනුමත කරනු ලබන ප්‍රකාශයන් අස්සන් කොට නිකුත් කිරීම ලේකම්වරයාගේ වගකීම වේ.

(08). 03. 03 ප්‍රධාන ලේකම්වරයා විසින් යවනු ලබන සෑම ලිපියකම පිටපතක් නායකයා වෙත යැවිය යුතුය.

84 - I 9

(08). 04 ජාතික සංවිධායක

විධායක සභාව මගින් ජාතික මට්ටමෙන් සංවිධානය කළ යුතු යැයි තීරණය කරනු ලබන දේශපාලන වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කිරීම සඳහා නායකත්වය ලබාදීම හා සංවිධානය කිරීම.

මැතිවරණ අවස්ථාවන්හි දී විධායක සභාව මගින් තීරණය කරනු ලබන ජාතික මට්ටමේ මැතිවරණ වැඩ පිළිවෙළවල් සංවිධානය කිරීම හා ඒවා අධීක්ෂණය කිරීම.

ඉහත කී වැඩ පිළිවෙළවල් වලට අදාළව පත්කරනු ලබන ප්‍රාදේශිය හා වෙනත් කමිටු වෙත පවරා දෙන ලද කාර්යභාරයන් අධීක්ෂණය කිරීම හා ඒවා පිළිබඳව විධායක සභාවට වාර්තා කිරීම.

මෙම සන්ධානයේ සාමාජිකත්වය දරණ පක්ෂ සමග සම්බන්ධීකරණය හා සහයෝගය වර්ධනය කිරීමට අවශ්‍ය කටුයතු කිරීම.

(08). 05 භාණ්ඩාගාරික

සන්ධානයේ සාමාජික පක්ෂවලින් ලැබෙන සාමාජික මුදල් ද , පරිත්‍යාග ද ඇතුළු සන්ධානය වෙනුවෙන් ලැබෙන සියලු මුදල් පරිපාලනය කිරීම හා ඒ පිළිබඳ නිවැරදි වාර්තා පවත්වා ගෙන යාම භාණ්ඩාගාරිකවරායාගේ වගකීම වේ.

සන්ධානයේ කටයුතු සඳහා අවශ්‍ය මුදල් රැස්කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රමෝපායන් සොයා බලා විධායක සභාවේ අනුමැතිය අනුව ඒවා ක්‍රියාත්මක කොට සන්ධානයේ අරමුදල් රැස්කිරීමේ වගකීම ද භාණ්ඩාගාරිකවරයා වෙත පැවරේ.

වර්ෂයකට වතාවක් සන්ධානයේ අරමුදල් හා වියදම් පිළිබඳව වාර්තාවක් විධායක සභාවට ඉදිරිපත් කළ යුතු අතර, විශේෂ අවස්ථාවන්හිදී අරමුදල් රැස්කොට ඉටු කරනු ලබන කාර්යන්හිදී ඒ පිලිබඳව වෙනම ගිණුම් වාර්තාවක් එකී කටයුත්ත අවසන් කිරීමෙන් පසු පැවැත්වෙන විධායක සභාවට අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතුය.

විධායක සභාව මගින් නියම කරනු ලබන ආකාරයකට බැංකු ගිණුම් පවත්වාගෙන යාම ද එකී බැංකු ගිණුම්වලට අදාල සියලු චෙක්පත් සහ අනෙකුත් ලේඛන භාරයේ තබා ගැනීම ද භාණ්ඩගාරිකවරයා වෙත පැවරේ

කිසියම් හෝ හේතුවක් නිසා සන්ධානය විසුරුවා හැරීමට සිදුවු අවස්ථාවක දි සන්ධානය සතුව ඇති මුදල් හා සියලු චංචල , නිශ්චල දේපළ එම අවස්ථාවේදී පවත්නා විධායක සභාව විසින් තිරණය කරනු ලබන පිළිගත් පුණ්‍යායතනයකට පැවරිය යුතුය

(09) විධායක සභාවේ රැස්වීම්

(09). 01 විධායක සභාවේ රැස්වීම් සඳහා ගණපුරණය විධායක සභාවේ සම්පුර්ණ සාමාජික සංඛ්‍යාවෙන් 1/3 ක් වන අතර , ඊට සන්ධානයේ නායක , ප්‍රධාන ලේකම් නිල දරන අය අනිවාර්යෙන් නියෝජනය විය යුතුය. යම් පෞද්ගලික අපහසුතාවක් හෝ වෙනත් හේතුවක් මත එකී නිල දරන නිලධාරින්ට විධායක සභාවේ රැස්වීම් සඳහා සහභාගිවීමට නොහැකි නම් එකී නිලධාරියා නියෝජනය කිරීම සඳහා විධායක සභාවේ සභික සාමාජිකයන්

අතුරෙන් සාමාජිකයෙකු අදාල පක්ෂය විසින් පත් කළ යුතුය. මාස තුනකට වරක් විධායක සභාව රැස්විය යුතුය.

(09). 02 විධායක සභාවේ සියලු රැස්වීම් සන්ධානයේ නායකයා විසින් කරනු ලබන නියෝගයක් මත ප්‍රධාන ලේකම්වරයා විසින් කැඳවිය යුත්තේය.

(09). 03 හදිසි කාරණයක් පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා විධායක සභාවේ සභිකයන්ගෙන් 1/3 ක අත්සන් සහිතව ලිඛිත ඉල්ලීමක් සන්ධානයේ නායකයා වෙත ඉදිරිපත් කළ අවස්ථාවක දී එකී ඉල්ලීම ලැබී දින 07 ක් නොඉක්මවන කාලය තුළදී එකී ඉල්ලීමේ සඳහන් කාරණය සාකච්ඡා කිරීම සඳහා සන්ධානයේ නායකයා විසින් විධායක සභාව කැඳවීමට පියවර ගත යුතුය.

(09). 04 විධායක සභාවේ සෑම රැස්වීමකටම සහභාගිවීම විධායක සභාවේ සාමාජිකයන්ගෙන් යුතුකම වේ. කලින් දැන්වීමක් නොමැතිව පිට පිටම විධායක සභා රැස්වීම් තුනකට සහභාගි නොවන විධායක සභාවේ සාමාජිකයන්ගේ විධායක සභික සාමාජික ධුරය ආහෝසි වේ.

(10) විශේෂ විධි විධාන

(10). 01. මෙම ව්‍යවස්ථාවලියේ විධිවිධාන උල්ලංඝනය කරන හෝ සන්ධානයේ තීරණවලට පටහැනිව ක්‍රියාකරන යම් සාමාජික පක්ෂයක් හෝ සංවිධානයක් විධායක සභාව විසින් අනුමත කරන යෝජනා සම්මතයක් මගින් නෙරපා දැමිය හැකිය.

(10). 02 සන්ධානයේ සාමාජික පක්ෂයන්හි සියලු සාමාජිකයන් සියලු කටයුතු සඳහා සන්ධානයේ සාමාජිකයන් ලෙස සලකනු ලබන අතර ඒ සඳහා සන්ධානයට නැවත ඇතුළුවීමක් හෝ සාමාජික මුදලක් ගෙවීමට අවශ්‍ය නොවේ.

(10). 03 සන්ධානයේ නාම යෝජනා ලැයිස්තුවක් මත තෝරා පත්කරගනු ලැබූ පාර්ලිමේන්තු හෝ පළාත් සභා හෝ පළාත් පාලන ආයතනයක මන්ත්‍රිවරයෙකු තමා තෝරා පත්කර ගැනු ලැබූ මන්ත්‍රිධුරය සඳහා තරග කළ අවස්ථාවේ හෝ ඉහත කී මන්ත්‍රිධුරය සඳහා තෝරා පත් කර ගැනීමෙන් පසුව ද විනය හේතුමත අදාල මන්ත්‍රීවරයාගේ සන්ධානයේ සාමාජිකත්වය අහෝසි කලවිට එම ඉවත්කිරීම මැතිවරණ කොමසාරිස්වරයා හෝ මැතිවරණ කොමිසම හෝ අදාල සභාවේ පළාත් සභාවේ ලේකම් හෝ පළාත් පාලන ආයතනයේ ලේකම් හෝ භේරීම්භාර නිලධාරියා හෝ පාර්ලිමේන්තු මහ ලේකම්වරයා වෙත දැනුම් දීම සන්ධානයේ ප්‍රධාන ලේකම්වරයාගේ වගකීම වන්නේය.

(10) 04. යම් මැතිවරණයක් සඳහා නාම යෝජනා සන්ධානය මගින් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එකී මැතිවරණවලට මුහුණදීම සඳහා මෙම ව්‍යවස්ථාවේ 6.3 වගන්තිය ප්‍රකාර, විධායක සභාව මගින් එහි දක්වා ඇති පරිදි එකී මැතිවරණ ක්‍රියා පටිපාටිය සඳහා දිස්ත්‍රික් කමිටු පත්කළ හැකි. එකී දිස්ත්‍රික් කමිටු ද එකී 6.3 වගන්තියේ සඳහන් විධායක මණ්ඩලයේ බලතල හා විධානයන්ට සම්පූර්ණයෙන් යටත් විය යුතුය. විධායක මණ්ඩලයේ විශේෂ අනුමැතිය මත සුවිශේෂ දේශපාලන කටයුතු සඳහා අවශ්‍ය වන කමිටු 6. 3 වගන්තියට පත් කළ හැක.

(10). 05 සන්ධානයේ සාමාජික පක්ෂ අතර සමගිය හා සහයෝගය නිරතුරුව පවත්වාගෙන යාම සඳහාත් , සන්ධානයේ තිරසාර පැවැත්ම සඳහාත් එහි සාමාජික පක්ෂවල සාමාජිකයන්, සියලු ජනතා නියෝජිතයන් , සියළු මට්ටම්වල දේශපාලන නායකයන් ද , වෘත්තිය සමිති, අනුබද්ධ සංවිධාන හා ඒවායේ ක්‍රියාකාරින්ද , සාමාජික පක්ෂ මගින් පවත්වාගෙන යනු ලබන විවිධ ජනමාධ්‍ය ඒකක හා පුවත්පත් ද අනුගමනය කළ යුතු චර්යාධර්ම පද්ධතියක් සන්ධානයේ විධායක සභාව මගින් සකස් කොට අනුමත කර කටයුතු කිරීමට සන්ධානයේ විධායක සභාව මගින් සකස් කොට අනුමත කර , කටයුතු කිරීමට සන්ධානයේ සියලු සාමාජික පක්ෂ , එහි සාමාජිකයින් ද , සියළු අනුසංවිධානයන් ද බැඳි සිටී.

(11) පොදු විධි විධාන

(11). 01 මෙම ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධානයන් අර්ථ නිරූපනය කිරීමේ පූර්ණ බලය විධායක සභාව සතු වන්නේය.

(11). 02 විධායක සභාවේ අභිමතය පරිදි නොපැමිණි අයද සමග 2/3 ක බහුතර ඡන්දයෙන් මෙම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා පූර්ණ බලය විධායක සභාව සතු වන්නේය.